# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1911/6 - 2015 අප්‍රේල් මස 22 වැනි බදාදා - 2015.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ**
**මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ**
**සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ධුරයෙන් ඉවත් කිරීම හේතු කොට ගෙන මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන තෙබුවත්තේ ගමරාලලගේ ආනන්ද ශ්‍රී ධම්සේන අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා විදාන ආරච්චිලාගේ පද්මසිරි හේමචන්ද්‍ර මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි ඉන්දික හතුරුසිංහ වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, විදාන ආරච්චිලාගේ පද්මසිරි හේමචන්ද්‍ර මහතා මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඉන්දික හතුරුසිංහ,
තේරීම් භාර නිලධාරී,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 21 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පොළොන්නරුව.

05 - 85

1A - G 21404— 36 (2015/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**උඩපළාත ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අවසන් වීම හේතු කොට ගෙන උඩපළාත ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පෙරියාසාමි මයිල්වාගනම් නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන කඳුරට ජනතා පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරන ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ උඩපළාත ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන බාලක්‍රිෂ්නන් ශ්‍රීදර් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

උඩපළාත ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, බාලක්‍රිෂ්නන් ශ්‍රීදර් මහතා උඩපළාත ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම් භාර නිලධාරී,
උඩපළාත ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 17 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

05 - 97

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.